සැ. යු.- 2011.02.03 දින පළවූ අංක 1692 දරන ගැසට් පත්‍රයේ I - II (අ) කොටස පළ නොවීය.


# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,693 - 2011 පෙබරවාරි මස 11 වැනි සිකුරාදා - 2011.02.11

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස : (IIඅ) වැනි ඡේදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| තනතුරු - ඇබෑර්තු ... ... ... ... | 166 | විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | 168 |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.**

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2011 පෙබරවාරි මස 18 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2011 පෙබරවාරි මස 03 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**ලක්ෂමන් ගුණවර්ධන,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2011 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.


163- B 80196— 8,8925 (2011/02)
B1-

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන රාජ්‍ය සේවා පත් කිරීම්වලට අදාළ වන පොදු කොන්දේසි

**අවශ්‍ය සාමාන්‍ය සුදුසුකම් :**

1.1 තමා ශ්‍රී ලාංකිකයෙකු බවට ප්‍රමාණවත් සාක්ෂි සෑම අයදුම්කරුවකු විසින් ම ඉදිරිපත් කළ යුතුය.

ශ්‍රී ලාංකික යනුවෙන් අදහස් කෙරෙනුයේ ලංකා පුරවැසි පනතේ අර්ථ දක්වා ඇති පරිදි පාරම්පරික වශයෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසිකම් ලැබූවෙකි.

1.2 ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට වඩා උසස් විභාගයකින් සමත් වී තිබීම අවම අධ්‍යාපනික සුදුසුකමක් වශයෙන් නියම කොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවෙකු සිංහල හෝ දෙමළ හෝ මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ අයෙකු වේ නම්, ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ සිංහල හෝ දෙමළ හෝ භාෂාව විෂයයෙන් අවස්ථාවෝචිත පරිදි සමත් වී සිටිය යුතු ය. (1961 ජනවාරි මස 01 වැනි දිනට පෙර දිනක සිට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින්නාවූත් රාජ්‍ය සේවයෙහි වෙනත් තනතුරුවලට ඉල්ලුම් කරන්නාවූත් නිලධාරීන් විෂයයෙහි මෙම නියමය අදාළ නොවන්නේ ය.)

*1.3 අයදුම් කරනු ලබන තනතුර සඳහා නියමිත ඉහළම රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණවලින් නිදහස් කිරීමට හිමිකම් ලබන සුදුසුකම් පසු කලක දී ලබා තිබේ නම් මිස, නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණය සමත්වීමට අපොහොසත්වීම නිසා පරිවාස/පරීක්ෂණ කාලයකට යටත්ව දෙන ලද සිය පත්වීම අවසන් කරනු ලැබූ, සිංහල හෝ දෙමළ හෝ නොවන භාෂා මාධ්‍යයකින් රජයේ සේවයට ඇතුළත්ව සිටි නව ප්‍රවේශක නිලධාරීන්ගෙන් ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

**2. සේවා කොන්දේසි - සාමාන්‍ය :**

2.1 රාජ්‍ය සේවයෙහි යෙදී සිටින සියලු ම නිලධාරීහු මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය, දෙපාර්තමේන්තු නියෝග හෝ රෙගුලාසි සහ රජය විසින් වරින් වර නිකුත් කරනු ලැබිය හැකි වෙනත් නියෝග හෝ රෙගුලාසිවලට යටත් විය යුත්තා හ.

2.2 අදාළ අමාත්‍යාංශයෙහි ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි ප්‍රමාණයේ මුදලක් එම ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි අන්දමකින් ඇප තබන ලද රාජ්‍ය සේවා නිලධාරීන්ගේ (ඇප) ආඥාපනත යටතේ රාජ්‍ය නිලධාරියකුට නියම කරනු ලැබිය හැකි ය.

2.3 දිවයිනේ ඕනෑ ම තැනක සේවය කිරීමට රාජ්‍ය නිලධාරියෙකුට නියම කරනු ලැබිය හැකිය.

**3. ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීන්ට අදාළ සේවා කොන්දේසි**

3.1 ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරිහු පූර්වෝක්ත 2 වැනි වගන්තියේ සඳහන් කොන්දේසිවලට අතිරේක වශයෙන් පහත දැක්වෙන අනිකුත් කොන්දේසිවලට ද යටත් විය යුතුය.

3.1.1 යම්කිසි තනතුරක පරිවාස කාලය අවුරුදු තුනකට වැඩි විය යුතු යැයි සලකනු ලබන්නේ නම් විනා එසේ නොමැති නම් සියලු ම පත් කිරීම් අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වනු ඇත. පරිවාස කාලය තුළ හේතුවක් නොදක්වා සේවය නතර කරනු ලැබිය හැකිය.

3.1.2 සියලු ම රාජ්‍ය නිලධාරීහු රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියෙහි අවශ්‍යතාවයන් සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ IV වන පරිච්ඡේදයේ විධිවිධාන සහ රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පවත්නා වූ සහ මින් මතු පනවනු ලබන්නාවූ අනෙකුත් නීති, රෙගුලාසි සහ ව්‍යවස්ථා ද පිළිපැදිය යුත්තාහ.

3.1.3 රාජ්‍ය භාෂාවකින් වැඩ කිරීමට හැකිවන අන්දමේ දැනුමක් තමන්ගේ පරිවාස කාලය ඇතුළත ලබාගන්නා ලෙස සිංහල හෝ දෙමළ නොවන භාෂා මාධ්‍යයකින් රාජ්‍ය සේවයට ඇතුළත් වූ නිලධාරීන්ට නියම කෙරේ.

3.1.4 සිංහල හෝ දෙමළ හෝ නොවන වෙනත් භාෂා මාධ්‍යයකින් සේවයට ඇතුළත් වූ නිලධාරියෙකු පරිවාස කාලය අවසානයේ දී තනතුරෙහි ස්ථිර කරනු ලැබීමට අදාළ වන වෙනත් කරුණු අතර, අවුරුද්දක් ඇතුළත කවර හෝ රාජ්‍ය භාෂාවකින් නියමිත ප්‍රවීණතා පරීක්ෂණයෙහි I වැනි ශ්‍රේණියෙන් සමත්වීමත්, අවුරුදු දෙකක් ඇතුළත II වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් (අවශ්‍යනම්) අවුරුදු තුනක් ඇතුළත III වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් බලපවත්වනු ඇත.

නියමිත කාල සීමා ඇතුළත දී පරීක්ෂණයකින් අසමත් වුවහොත් වැටුප් වර්ධකයක් තාවකාලිකව අත්හිටුවනු ලැබිය හැකි ය. නියමිත කාලසීමාව ඉක්මවා තව මාස හයක කාලසීමාවක් ඇතුළත යථෝක්ත පරීක්ෂණයෙන් සමත්වීමට අසමත් වුවහොත් එසේ වැටුප් වර්ධක තාවකාලිකව අත්හිටුවීම, වැටුප් වර්ධක නතර කිරීමකට පරිවර්තනය කෙරෙනු ඇත. පරීක්ෂණයෙන් සමත්වන තෙක් හෝ පහත දැක්වෙන 3.1.6 වැනි වගන්තියේ විධිවිධානයන් බලපවත්වන තෙක් හෝ යථෝක්ත වැටුප් වර්ධකයන් නතර කිරීම ක්‍රියාත්මක වන්නේය.

3.1.5 මෙවැනි නිලධාරීන්ට පත්වීම ලැබීමෙන් පසු රාජ්‍ය භාෂාවක ප්‍රවීණතාවය ලබා ගැනීම පිණිස මාස හයක කාලයක් සඳහා පූර්ණ වැටුප් සහිත පහසුකම් සැලසිය යුතුය. ඉන් අනතුරුව අදාළ ප්‍රවීණතා විභාගයට ඔහු පෙනී සිටිය යුතු අතර, එම විභාගයෙන් අසමත් වුවහොත් පූර්ණ වැටුප් සහිත මාස හයක කාල පරිච්ඡේදයෙන් පසු ඒ සමඟම එළඹෙන අවුරුදු දෙකක කාල පරිච්ඡේදය තුළ තමාගේ සාමාන්‍ය රාජකාරිවල නිරත වෙමින් සිටිය දී විභාගයෙන් සමත්වීමට ඔහුට අවස්ථාව සලසා දෙනු ලැබේ.

3.1.6 නියමිත අවුරුදු දෙකහමාරක කාල පරිච්ඡේදය තුළ විභාගයෙන් සමත්වීමට නොහැකි වුවහොත් ඔහුගේ සේවය අවසන් කරනු ලැබේ.

3.1.7 රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරක දැනටමත් ස්ථිර කරනු ලැබ සිටින රාජ්‍ය නිලධාරියෙකු රාජ්‍ය සේවයෙහි වෙනත් ස්ථිර තනතුරකට පත් කරනු ලැබූ විට යළි පරිවාස කාලසීමාවක් සේවය කරන ලෙස සාමාන්‍යයෙන් ඔහුට නියම කරනු නොලැබේ. එවැනි නිලධාරියෙකු සිය නව තනතුරෙහි කරන සේවය පරීක්ෂා කර බැලීම සඳහා ප්‍රථමයෙන් එම තනතුරෙහි නියමිත කාලසීමාවක් වැඩ බැලීම සඳහා ඔහු පත් කරනු ලැබිය හැකි ය.

3.1.8 (රාජ්‍ය සේවයෙහි දැනටමත් ස්ථිර/තාවකාලික තනතුරු දරන්නා වූ ද වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබුවා වූ ද, අය හැර) තෝරාගනු ලැබූ අපේක්ෂකයන් දිවයිනේ ඕනෑම පෙදෙසක සේවය කිරීමට ශාරීරිකව සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට ඉදිරිපත්වන ලෙස ඔවුනට නියම කරනු ඇත.

**4. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි**

4.1 ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට පත් කරනු ලබන රාජ්‍ය නිලධාරීන් විසින් ඔවුන්ගේ වැටුපෙන් අයකර ගතයුතු යැයි රජය විසින් නියම කරනු ලබන ප්‍රතිශතයක ප්‍රමාණයට සමාන මුදලක් ස්වකීය වැටුපෙන් වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් වශයෙන් ගෙවිය යුතුය.

4.2 අර්ථසාධක අරමුදල් පදනම මත ස්ථිර හෝ තාවකාලික තනතුරුවලට පත්කරනු ලැබූ රාජ්‍ය නිලධාරීන් ස්වකීය ඒකාබද්ධ වැටුපෙන් 6%ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතු වන්නේ ය. මුදල් වර්ෂය අවසානයේ දී අනිවාර්ය දායක මුදල් වශයෙන් අරමුදලට බැරකර ඇති මුදල් ප්‍රමාණය මෙන් 150%ක මුදල් ප්‍රමාණයක් රජය විසින් එම අරමුදලට රජයේ දායක මුදල වශයෙන් ගෙවනු ඇත.

4.3 පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලබන රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු උසුලන්නා වූ නිලධාරීන් සහ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබ පළාත් පාලන සේවයේ (විශ්‍රාම වැටුප් සහිත) තනතුරු උසුලන්නා වූ නිලධාරීන්හට පිළිවෙලින් ඔවුන්ගේ පළාත් පාලන සේවයේ සහ රාජ්‍ය සේවයේ තනතුරු සහ විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ.

4.4 විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබූ යුද, නාවික සහ ගුවන් හමුදාවේ නිත්‍ය සේවයෙහි නියුතු පිරිසට ඔවුන්ගේ රාජ්‍ය සේවයෙහි තනතුරු සඳහා විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ. මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සහිත බවට ප්‍රකාශිත තනතුරක රාජ්‍ය නිලධාරියෙක් ලෙස පත්වීමක් භාර ගැනීම සඳහා මුදා හරිණු ලැබූ සන්නද්ධ හමුදාවක යම් සාමාජිකයෙකුගේ සම්පූර්ණ වැටුප් සහිත අහිමි නොවූ සේවා කාලසීමාව මේ ව්‍යවස්ථා සංග්‍රහයේ පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද, මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ගෙවිය යුතු යම් විශ්‍රාම වැටුප් පාරිතෝෂිකයක කාර්යය සඳහා ගණන් ගත යුතු ය.

**5. යුද්ධ සේවා අනුග්‍රහය**

5.1 එක්සත් රාජ්‍ය යුද්ධාවතීරණ හමුදාවන්හි සේවා මුක්ත භටයින් ද, සහාය ගිනි නිවන, ගගන ප්‍රහාර නිවාරණ සහ මහජන ආරක්ෂක සේවාවන්හි පූර්ණකාලීන සාමාජිකයන් වශයෙන් නියුක්තව සිටි තමන්ගේම ඕනෑකමින් එම සේවාවන්ගෙන් අස්ව නොගිය අයට ද ඉහත කී සියලු සුදුසුකම් තිබේ නම් ද ඔවුන් මෙම හමුදාවන්ට බැඳී ඇත්තේ 1954 අගෝස්තු මස 15 වැනි දිනට පෙරාතුව නම් ද, ඔවුන්ගේ එම සේවාවන් සතුටුදායක ලෙස සහ අඛණ්ඩව පැවතිණි නම් ද, වයස අතින් සුදුසුකම් ලබා ගැනීම සඳහා ඔවුන්ට තමන්ගේ වයස්වලින් 1939 සැප්තැම්බර් මස 03 වැනි දින සිට 1949 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා වූ කාලසීමාව තුළ තම තමන් සේවය කළ කාලයන් අඩුකර ගැනීමට ඉඩදෙනු ලැබේ.

**6. රාජ්‍ය සේවයෙහි දැනට සේවය කරන නිලධාරීහු**

6.1 රාජ්‍ය සේවයෙහි දැනට සේවයෙහි යෙදී සිටින්නාවූත්, අවශ්‍ය සියලු සුදුසුකම් ඇත්තාවූත්, නිලධාරීන් විසින් ඉදිරිපත් කරන අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් එවිය යුතුය. නව තනතුරු සඳහා ඉල්ලුම් කරන්නා වූ ද, රාජ්‍ය සේවයෙහි දැනට ස්ථිර තනතුරු දරන්නා වූ ද, නිලධාරීන්ගෙන් යමෙකු නව තනතුරකට තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා ඔවුන් මුදවාලිය හැකි ද නොහැකි ද යන්න එම නිලධාරීන් සේවයෙහි යෙදී සිටින දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් විසින් ඔවුන්ගේ අයදුම්පත් ඉදිරිපත් කරන විට සඳහන් කළ යුතු ය.

6.2 නියමිත වේලාවක නියමිත ස්ථානයක දී සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටින ලෙස අයදුම්කරුවන්ට නියම කරනු ලැබිය හැක. මේ සම්බන්ධයෙන් දුරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් වියදම් ආදියත් ගෙවනු නොලැබේ.

6.3 යම්කිසි අයදුම්කරුවකු නිර්දේශ කිරීමට අදහස් කරන කෙනෙකු විසින් අයදුම්කරුට චරිත සහතිකයක් දීමෙන් එසේ කළ යුතු ය. යම් අයදුම්කරුවකු තෝරා ගන්නා පරිද්දෙන් කවර අන්දමේ වුව ද අයථා අනුග්‍රහයන් පැතීම හෝ එහිලා යම් බලපෑමක් කිරීමට තැත් කිරීම හෝ එම අයදුම්කරු නුසුදුස්සකු කරනු ලැබීමට හේතුවනු ඇත.

6.4 අයදුම්කරුගේ අයදුම්පතෙහි කිසියම් සාවද්‍ය ප්‍රකාශයක් තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැන ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන් ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් ඔහු රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

6.5 මෙම දැන්වීමෙහි සඳහන් වන නියමයන්ට සෑම අතින් ම අනුකූල නොවන අන්දමේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**7. සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප් යන්නෙහි අර්ථ දැක්වීම**

7.1 සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප යන්නෙන් අදහස් කෙරෙනුයේ ඒකාබද්ධ වැටුප පමණකි. වැඩ බැලීමේ වැටුපක් හෝ දීමනා ආදිය ඊට ඇතුළත් නොවන්නේ ය.

**8. බඳවා ගැනීම සහ උසස් කිරීම සම්බන්ධ නව ජාතික ප්‍රතිපත්තිය**

පසුව නිකුත් කෙරෙන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ මගින් සංශෝධනය කිරීමට යටත්ව 1990.08.09 දිනැති අංක 15/90, 1990.03.05 දිනැති අංක 15/90(I) සහ 1990.06.15 දිනැති අංක 15/90 (II) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවල දක්වා ඇති ප්‍රතිපත්තියට අනුකූලව රාජ්‍ය සේවයට, පළාත් රාජ්‍ය සේවයට, රාජ්‍ය සංස්ථා අංශයට සහ රජයට සම්පූර්ණයෙන්ම අයත් සමාගම්වලට බඳවා ගැනීම සහ උසස් කිරීම 1990.01.01 වැනි දින සිට සිදුකරනු ඇත.

# විභාග අපේක්ෂකයන් සඳහා නීති සහ උපදෙස්

"1968 අංක 25 දරන විභාග පනතේ දක්වා ඇති විධිවිධානයන්ට අනුකූලව කටයුතු කිරීමට සියලුම විභාගාපේක්ෂකයින් බැඳී ඇත"

සියලු ම විභාගාපේක්ෂකයින් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතුය. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපේක්ෂකයෙකුට විභාග කොමසාරිස්ගේ අභිමතය පරිදි පහත සඳහන් දඬුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පමුණුවනු ලැබිය හැකිය :-

(i) මුළු විභාගයටම හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එක් විෂයයකට හෝ ඉන් කොටසකට පෙනී සිටීම හෝ තහනම් කිරීම,
(ii) විභාගයේ එක් විෂයයකට හෝ මුළු විභාගයටම හෝ නුසුදුස්සෙකු කිරීම,
(iii) එක් අවුරුද්දකට හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,
(iv) මුළු ජීවිත කාලයේ ම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,
(v) සහතික පත්‍රය යම්කිසි කාල සීමාවක් තුළ තහනම් කිරීම,
(vi) විභාගාපේක්ෂකයාගේ ක්‍රියා පරිපාටිය සම්බන්ධයෙන් ඔහු ගැන වගකිවයුත්තන්ට සැලකර සිටීම හෝ විභාගාපේක්ෂකයා පොලීසියට භාරදීම හෝ ඔහුගේ ක්‍රියාව සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරීම.

විභාගයට කලින් හෝ විභාගය පවත්වාගෙන යන අතරතුර හෝ විභාගයට පසුව හෝ කොයිම අවස්ථාවකදී වුවත් එවැනි විභාගාපේක්ෂකයෙකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් සතු වේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේ ය. එහෙත් රජයේ සේවකයන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාග පිළිබඳ ව විභාග කොමසාරිස්ගේ තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සමීක්ෂණයට යටත් වන්නේ ය.

1. සියලු ම විභාගාපේක්ෂකයන් විභාග ශාලාව තුළදීත් ඒ අසලදීත් විභාග ශාලාධිපතීන්ට ද, ඔහුගේ සහකාරයින්ට ද, අනිකුත් විභාගාපේක්ෂකයින්ට ද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස ශාන්තදාන්තව හැසිරිය යුතුය. විභාග ශාලාවට ඇතුළු වන විටත්, ඉන් පිටවන විටත් ඉතා සන්සුන් ලීලාවෙන් හැසිරිය යුතුය.

2. විභාගාපේක්ෂකයෝ විභාග ශාලාධිපතීන්ට කීකරු විය යුත්තාහ. එබැවින් ඔවුන් විභාගය පවත්වාගෙන යන අතරතුරත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාග ශාලාධිපතීන්ගේ හා ඔහුගේ සහකාරයන්ගේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය.

3. විභාගයේ දී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලිවීම පටන්ගෙන පැය භාගයක් ගතවූවාට පසු මොනම කාරණයක් නිසාවත් විභාගාපේක්ෂකයෙකු විභාග ශාලාවට ඇතුළු කරගනු නොලැබේ. විභාගය පටන් ගෙන පැය භාගයක් ගතවන තුරු ප්‍රශ්න පත්‍රයට පෙනී සිටින අපේක්ෂකයෙකුට විභාග ශාලාවෙන් පිටවී යාම තහනම්ය. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචික පරීක්ෂණවලට පමා වී පැමිණෙන අපේක්ෂකයන් විභාග ශාලාවට ඇතුළු නොකිරීමට ඉඩ තිබේ.

4. සෑම විභාගාපේක්ෂකයෙකුම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුය. විභාග ශාලාධිපතිගේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුයි. තමන්ට නියම නොකරන ලද අසුනක් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට සිදුවේ.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන් ම නිශ්ශබ්ද ව සිටිය යුතු ය. මොන ම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළත දී විභාග ශාලාවේ කාර්ය මණ්ඩලයේ කෙනෙකු සමග හැර, විභාග ශාලාව ඇතුළත හෝ පිටත හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතාබස් කිරීම හෝ පණිවුඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන්ම තහනම්ය. යම් කිසි හදිසි වුවමනාවක් සඳහා කිසිවෙකු සමග කතාබස් කිරීමක් අවශ්‍ය වුවහොත් ප්‍රථමයෙන් ඒ සඳහා විභාග ශාලාධිපතින්ගේ අවසරය ලබා ගත යුතු යි.

6. විභාගාපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රය හඳුනාගනු ලබන්නේ ඔහුගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම නොලිවිය යුතුයි. තමාගේ උත්තර පත්‍රයෙහි අන්‍ය විභාගාපේක්ෂකයෙකුගේ විභාග අංකය ලිවීම වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් ලෙස සලකනු ලැබේ. හඳුනාගත නොහැකි පරිදි විභාග අංකය ලියා ඇති උත්තර පත්‍ර ප්‍රතික්ෂේප කිරීමට ද සිදුවෙනවා ඇත.

7. තමන් වෙත සපයන ලද කඩදාසි හැර තීන්ත පොවන කඩදාසියෙහි හෝ ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙන කිසි තැනක හෝ කිසිවක් නොලිවිය යුතුය. මේ නීතිය නොසැලකීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියා කිරීමක් ලෙස සැලකිය හැකි වේ.

8. තමන් වෙත සපයන ලද කඩදාසියක් හෝ උත්තර ලියන පොතක් හෝ ඉරාදැමීම හෝ පොඩි කිරීම හෝ නමා දැමීම හෝ අකාමකා දැමීම හෝ නොකළ යුතුය. කටුවැඩ ආදිය සඳහා පාවිච්චි කරන ලද සෑම කඩදාසියක්ම උත්තර පත්‍රයට ඇමිණිය යුතු ය. ඒවා උත්තර පත්‍රයෙහිම කොටසක් විය යුතු ය. එබඳු කටුවැඩ පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. විභාග ශාලාවේ දී ලියන ලද කිසිම දෙයක් ඉන් පිටත ගෙනයෑම තහනම් ය. එකම ප්‍රශ්නයකට පිළිතුරු දෙතැනක ලියැවී තිබේ නම් අනවශ්‍ය පිළිතුරු පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. මේ කරුණු පැහැර හැරීම වංචාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් සේ සැළකීමට ඉඩ තිබේ.

9. ගණිත ප්‍රශ්නවල දී ගණන් වරදවා සාදා හෝ ගණනක් කොහෙත්ම නොසාදා හෝ නිවැරදි පිළිතුරු දැක්වීමත් චිත්‍ර කර්මයේ දී තමන්ගේ චිත්‍රය තවත් අපේක්ෂකයෙකුගේ චිත්‍රයට ආකල්ප මාත්‍රයෙන් හෝ ස්වරූපයෙන් හෝ ක්‍රියාකාරිත්වයෙන් හෝ යනාදියකින් සමානව, එසේ නැතිනම් බොහෝ සෙයින්ම කිට්ටුවම තිබීමත්, වංචා සහගත ක්‍රියාවක් සේ සලකනු ලැබීමට හේතු විය හැකිය.

10. විභාගයේ දී උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටතට ගෙනයාම තහනම්ය. මේ සියලුම දෑ විභාග කොමසාරිස් සතුය. මේ නීතිය කඩකිරීම වංචනික චේතනාවකින් යුත් ක්‍රියාවක් ලෙස සැලකීමට හේතු විය හැකිය.

11. තමන් වෙත සපයන ලද ලිපිද්‍රව්‍ය හැර වෙනත් පොත්පත්, සටහන් පොත්, සාක්කුවේ පාවිච්චි කරන නෝට් පොත්, ඇක්සයිස් පොත් හා කඩදාසි කොළ හෝ කැබලි ද, තමන්ගේ පාට පෙට්ටි හා පාර්සල් ආදිය ද, පයිල් කවර, කාඩ්බෝඩ් පෑඩ්, නැවූ ප්‍රවෘත්ති පත්‍ර, බ්‍රවුන් පේපර් යනාදිය ද, විභාග ශාලාව තුළ සිටින කිසි විටෙක තමා වෙත හෝ සමීපයෙහි හෝ තබා නොගත යුතුය. මේ නීතිය කඩ කිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවකි.

12. විභාග ශාලාව තුළ කිසිම අපේක්ෂකයෙකු අත කිසිම පොතපතක් හෝ සටහන් පොතක් හෝ සටහන් ලියන කඩදාසියක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන්ම තහනම් ය. විභාගශාලාධිපතීන් නියම කළහොත් සෑම අපේක්ෂකයෙක්ම තමන් සන්තකව තිබෙන දෑ මේ මේ යයි සහතික කිරීමට බැඳී සිටී. මේ අවශ්‍යතා කඩකිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට යත්න දැරීමක් ලෙස සලකනු ලැබේ.

13. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ පොතපතකින් හෝ පත්‍රයකින් හෝ සටහන් සහිත කොළයකින් හෝ වෙන කිසිවකින් හෝ ගෙන, හොර උත්තර ලිවීම හෙවත් කොපි කිරීම, හොර උත්තර ලිවීමට යත්න දැරීමද තහනම් ය. තවත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයක් දෙස බැලීම ද නොකළ යුතුය. වෙන අයදුම්කරුවෙකුට උදව් දීමෙන් ද, වෙන අයදුම්කරුවෙකුගෙන් හෝ පුද්ගලයෙකුගෙන් හෝ උදව් ලබා ගැනීමෙන් ද සම්පූර්ණයෙන්ම වැළකිය යුතුය. උත්තර ලියා සම්පූර්ණ වූ සෑම කඩදාසියක්ම ලියමින් සිටින කඩදාසිය යට තබා ගත යුතුය. ලියන කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතුය.

14. ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත් ස්වල්ප වේලාවකටවත් විභාග ශාලාවෙන් පිටවී යාමට කිසිම අපේක්ෂකයෙකු ඉඩදෙනු නොලැබේ. එහෙත් යම්කිසි හදිසි කරුණක් නිසා විභාගාපේක්ෂකයෙකුට ඉන් පිටත යන්නට උවමනා වුවහොත් විභාග ශාලාධිපතිගේ සහකාර නිලධාරියෙකුගේ සුපරීක්ෂාකාරීත්වය යටතේ විභාග ශාලාවෙන් ඔහුට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එසේ පිටතට යාමට පෙරත් නැවත විභාග ශාලාවට ඇතුළු වන විටත් ඔහු සෝදිසියකට භාජනය විය යුතුය.

15. විභාග ශාලාවේ දී පිළිතුරු ලියන විට විභාගය පටන් ගැනීමට පෙර හෝ නියම විභාග අපේක්ෂකයෙකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයෙකු පෙනී සිටීම දඬුවම් ලැබිය යුතු ක්‍රියාවකි. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ බොරු අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීමත්, කෙනෙකුගේ අනන්‍යතා සහතිකය වෙනස් කිරීමත් එබඳු වරදවල් ය. විභාගාපේක්ෂකයන් එවැනි වරදට අසු නොවිය යුතුය.

16. විභාග අපේක්ෂකයෙකු නොවන අයෙක් කිසිම අපේක්ෂකයෙකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදව් දීම බරපතල වරදක් ලෙස සලකනු ලැබේ.

විභාග අපේක්ෂකයන් විසින් තමන්ගේ පරෙස්සම සඳහා පහත සඳහන් උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය. :—

(i) විභාගය පටන් ගන්නා නියමිත වේලාවට සෑහෙන පමණ කලින් විභාග ශාලාවට පැමිණෙන්න. එක් එක් ප්‍රශ්න පත්‍රය පටන් ගැනීමට නියමිත වේලාවට යටත් පිරිසෙයින් විනාඩි 10කට හෝ 15කට කලින් විභාග ශාලාවට පැමිණ සිටීම සෑහේ. විභාග ශාලාව පිහිටා ඇති ස්ථානය හරිහැටි නොදත් විට විභාගය පටන් ගන්නා දිනයට කලින් ඒ ගැන සොයා බලා නියම ස්ථානය හරි හැටි දැන සිටිය යුතුය.

(ii) යම්කිසි විෂයයකට ඇතුළත්වීම ගැන හෝ යම් විෂයයකට පෙනී සිටීමට ඇති සුදුසුකම් ගැන හෝ සැකයක් ඇති වූ විට එම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීමට පටන් ගැනීමට පෙර විභාග ශාලාධිපතීන්ට ඒ බැව් සැළකර එම සැකය දුරුකර ගත යුතුයි. එලෙස ක්‍රියා නොකිරීම එම විෂයය හෝ විෂයයන් සම්බන්ධයෙන් තමන්ගේ විභාගාපේක්ෂකත්වය අවලංගු වී යාමට හේතු විය හැකිය.

(iii) විභාගයට පෙනී සිටීමේ දී අපේක්ෂකයන් සෑම විෂයයකටම පෙනී සිටින විට අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කළ යුතුය. අනන්‍යතාවය ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවේ දී ඉදිරිපත් නොකළහොත් ඔහුගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ. යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාගශාලාවට ගෙන ඒමට අමතක වුවහොත් ඒ බැව් විභාගශාලාධිපතීන්හට දන්වා විභාගය අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීමට මං සළසා ගත යුතුය.

(iv) විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයකට අයත් ලිපිද්‍රව්‍ය (එනම් ලියන කඩදාසි, තීන්ත පොවන කඩදාසි, ලැජර් කඩදාසි, සාරාංශ ලියන කඩදාසි) ආදිය සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙදා දෙන වර්ගයකට වෙනස් වූ හෝ අමුතු මෝස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුණහොත් ඒ බව නොපමාව විභාගශාලාධිපතිට දැන්විය යුතුයි. විභාග ශාලාවේ දී ඔබට දෙනු ලබන කඩදාසි හැර වෙන මොනම කඩදාසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නොකළ යුතුයි. ඉතිරි වන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නොකර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ ලියන මේසය මත තබන්න. ඔබට ලඝුගණක චක්‍ර සපයන ලද්දේ නම් ඒවා පරිස්සමින් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තිබෙන්නට හැරිය යුතුය.

(v) විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, තීන්ත කූඩු, මකන, රෙදි කෑලි, අඩිකෝදු, ජ්‍යාමිතික උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි.

(vi) තමන් පාවිච්චි කරන සෑම කඩදාසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේ දී නොපමාව තමන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදාසියේ දෙපැත්තේම පැහැදිලිව ද පිරිසිදුව ද උත්තර ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනික් කොටස පටන් ගැනීමට පෙර එක රූලක්වත් හිස්ව තිබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලිවීමෙන් පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන සෑම දෙයක්ම එක ගොඩේ තෝරා බේරා ගන්නට නොහැකි ලෙස නොලිවිය යුතුයි.

(vii) උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තීරය වෙන්කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහා ය. දකුණු පැත්තේ තීරය වෙන්කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නොලිවිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයට හේතුවන බැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

(viii) අනිවාර්ය ප්‍රශ්න ද, තෝරා ගත යුතු අන් ප්‍රශ්න ද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින්ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමින් කියවා බැලිය යුතුයි. මෙය නොසලකා හැරීමෙන් බොහෝ විට පාඩු සිදුවිය හැකිය.

(ix) ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැන බැලීම සහ කටුවැඩ ඒ ඒ ගණන් සෑදීමේ කොටසක් වශයෙන් අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුය. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් හා චිත්‍ර ආදිය නිවැරදිව ද සෑහෙන පමණ විශාලව ද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරුවල දී එක පිටුවක අඳින ලද රූප සටහන් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත් සිත් යොමුකර විය යුතු අවස්ථාවල දී ඒ රූප සටහන් නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ.

(x) එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන් වූ විට උත්තර ලියන ලද කඩදාසි සියල්ලම ප්‍රශ්නවලට උත්තර ලියූ පිළිවෙල අනුව එකතුකොට වම් පැත්තේ ඉහළ කෙළවරේ තමන්ට සපයන ලද නූල් කැබැල්ලෙන් නොගැලවී යන පරිදි එකට තබා අමුණා ගැටගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නොගසන්න.

(xi) ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතීන්ට හෝ ඔවුන්ගේ සහකාර මහතකුට හෝ සියතින්ම භාරදිය යුතුය. නැතහොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනේම වාඩි වී සිටිය යුතුය. එසේ නොකිරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැති වී යාමට ද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවූවකු සේ සලකනු ලැබීමට ද හේතු විය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියුන් කෙනෙකුට හෝ වෙනයම් සේවකයෙකුට හෝ බාර නොදිය යුතුය.

(xii) යම්කිසි කරුණක් නිසා විභාග ශාලාධිපතීන්ට හෝ ඔහුගේ සහකාර මහතෙකුට හෝ කථා කිරීමට අවශ්‍ය වූ විට ද, කඩදාසි ආදිය අවශ්‍ය වූ විට ද තම ආසනයෙන් නොනැගිට අත පමණක් එසවිය යුතුය.

**විභාග කොමසාරිස් ජනරාල්.**

පැලවත්ත,
බත්තරමුල්ල,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ දී ය.

# තනතුරු - ඇබෑර්තු

## නීතිපති දෙපාර්තමේන්තුව

### තාවකාලික වැඩබලන රජයේ අධිනීතිඥ තනතුර

ඉහත සඳහන් තනතුර සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ. මේ සඳහා ඉල්ලුම්පත්‍ර කොළඹ 12, නීතිපති දෙපාර්තමේන්තුවේ කාර්යාලයෙන් ලබා ගත යුතුය.

(අ) වැටුප් පරිමාණය : රු. 28,095 (මාසික)

(ආ) අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් : ශ්‍රී ලංකාවේ ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥවරයෙක් විය යුතුය.

(ඇ) බඳවා ගැනීමේ ක්‍රමය :
මෙම තනතුරට බඳවා ගනු ලබන්නේ, සුදුසුකම් ලත් අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවා, රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද ලකුණු දීමේ පරිපාටියට අනුකූලව අනුමත සම්මුඛ පරීක්ෂණයේ නිර්දේශ මතය. සම්මුඛ පරීක්ෂණයේදී අයදුම්කරුවන් අදාළ ක්ෂේත්‍රයේ ලබා ඇති සුදුසුකම්, කාර්ය සාධනය, පළපුරුද්ද හා හැකියාවන් සලකා බලා සුදුසු අයදුම්කරුවන් තෝරාගනු ලැබේ.

(ඈ) සේවයේ නියුක්ත කිරීමේ කොන්දේසි :
තනතුර ස්ථිර නොවන අතර, විශ්‍රාම වැටුප් රහිතය.

ඉල්ලුම් පත්‍ර 2011 මාර්තු මස 14 වැනි දින අ. භා. 4.00ට පෙර කොළඹ 12, නීතිපති දෙපාර්තමේන්තුවට ලැබිය යුතුය.

අමාත්‍ය මණ්ඩලයේ නියමය පරිදි,

ලලිත් වීරතුංග,
ජනාධිපති ලේකම්.

වර්ෂ 2011ක් වූ ජනවාරි මස 25 වැනි දින,
කොළඹ දී ය.

02-259

---

## රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුව

රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුවේ යාන්ත්‍රික අධිකාරී II "ආ" (ශ්‍රී ලංකා තාක්ෂණ සේවය) තනතුරු පුරප්පාඩු 03ක් පිරවීම සඳහා මෙම නිවේදනයේ දක්වා ඇති අවම සුදුසුකම් සපුරා ඇති ශ්‍රී ලාංකික පිරිමි පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

01. *අයදුම්පත් ඉදිරිපත් කළ යුතු ආකාරය :*

01.01 මෙහි පහත දැක්වෙන ආදර්ශ අයදුම්පත්‍රය අනුව "A4" ප්‍රමාණයේ කඩදාසියක දෙපිට ම ප්‍රයෝජනයට ගනිමින් සකස් කරගත් අයදුම්පත් නිසි ලෙස සම්පූර්ණ කොට "කර්මාන්තශාලීය ඉංජිනේරු, රජයේ කර්මාන්තශාලාව, කොලොන්නාව" යන ලිපිනයට 2011 මාර්තු මස 11 වැනි දිනට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත බහා එවන ලියුම් කවරයේ ඉහල වම් කෙළවරේ අයදුම් කරන තනතුරු නාමය පැහැදිලිව ලියා තිබිය යුතු ය.

01.02 අයදුම්පත් භාරගන්නා අවසාන දිනට පසුව ලැබෙන අයදුම්පත් පිළිගනු නොලැබේ. තැපෑලේ දී ඇති වන ප්‍රමාදයන් වළක්වා ගැනීම වස් කල් වේලා ඇතිව ඉල්ලුම්පත් තැපැල් කරන මෙන් අයදුම්කරුවන්ට උපදෙස් දෙනු ලැබේ.

01.03 අයදුම්පතෙහි සඳහන් කර ඇති යම් අසත්‍ය තොරතුරක් බඳවා ගැනීමට පෙර අනාවරණය වුවහොත් අයදුම්කරුගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ. එබඳු අසත්‍ය තොරතුරක් බඳවාගැනීමෙන් පසුව අනාවරණය වුවහොත් සේවයෙන් පහ කිරීමට කටයුතු කරනු ලැබේ.

***සැළකිය යුතුයි.***-අයදුම්පත් ලද බව දන්වනු නොලැබේ. නියමිත සුදුසුකම් සපුරා නැති අයදුම්පත් සහ නියමාකාරයෙන් සම්පූර්ණ කර නොමැති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

02. *අධ්‍යාපන සුදුසුකම් :* ශුද්ධ ගණිතය/ව්‍යවහාර ගණිතය/සංයුක්ත ගණිතය සහ භෞතික විද්‍යාව සහිතව විද්‍යා විෂයයන් තුනකින් අ. පො. ස. (උ/පෙළ) විභාගය එකවර සමත්වීම සහ භාෂාව හෝ සාහිත්‍යය, ගණිතය, විද්‍යාව සහ තවත් එක් විෂයකට සම්මාන සහිතව විෂයයන් හයකින් (06) අ. පො. ස. (සා/පෙළ) විභාගය දෙවරකට නොවැඩි වාර ගණනක දී සමත්වීම.

03. *වෘත්තීය සුදුසුකම් :*

පහත සඳහන් වෘත්තීය සුදුසුකම්වලින් එකක් අයදුම්කරුවන් විසින් ලබා තිබිය යුතු ය.

(i) මොරටුව විශ්ව විද්‍යාලයේ හෝ අම්පාරේ හාඩි ආයතනය විසින් පිරිනමනු ලබන ජාතික තාක්ෂණික ඩිප්ලෝමාව (යාන්ත්‍රික);

හෝ

(ii) ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය විසින් පිරිනමනු ලබන ජාතික ඉංජිනේරු ඩිප්ලෝමාව (යාන්ත්‍රික);

හෝ

(iii) අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් පිරිනමනු ලබන ජාතික උසස් ඉංජිනේරු ඩිප්ලෝමාව (යාන්ත්‍රික);

හෝ

(iv) ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලය විසින් පිරිනමනු ලබන තාක්ෂණික ඩිප්ලෝමාව (යාන්ත්‍රික);

හෝ

(v) ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය විසින් පවත්වනු ලබන යාන්ත්‍රික ඉංජිනේරු විභාගයේ I වැනි කොටස සාර්ථකව සම්පූර්ණ කිරීම;

හෝ

(vi) උසස් අධ්‍යාපන අමාත්‍යාංශය සහ ඉහත සඳහන් තාක්ෂණ සහතික නිකුත් කරන ලද ආයතනවලින් විමසා අදහස් ලබා

ගැනීමෙන් අනතුරුව ඉහත සඳහන් තාක්‍ෂණ සුදුසුකම්වලට සියලු අතින් සමාන යැයි ශ්‍රී ලංකා තාක්‍ෂණ සේවා මණ්ඩලය විසින් පිළිගනු ලබන වෙනත් තාක්‍ෂණික සුදුසුකම් ලබා තිබීම.

04. *වෙනත් සුදුසුකම්* :විශිෂ්ඨ චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍යයකින් යුක්ත පිරිමි අයවලුන් විය යුතු ය.

05. *වැටුප් පරිමාණය* : රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 6/2006(iv) හි එම්එන් 3-2006ඒ යටතේ රු. 15,005 - 180x4 - 240x6-320x11-360x20-රු. 27,885 වැටුප් පරිමාණයේ පිහිටුවනු ලැබේ.

06. *වයස් සීමාව* : 2011.03.11 දිනට වයස අවුරුදු 18ට නොඅඩු හා 40ට නොවැඩි වීම. (දැනටමත් රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුතු වූවන්ට උපරිම වයස් සීමාව අදාල නොවේ.)

07. *බඳවා ගැනීමේ ක්‍රමය* : සුදුසුකම් සහිත අයදුම්කරුවන් ලිඛිත තරග විභාගයකට යොමුකර, එම විභාගයේ වැඩිම ලකුණු ලබාගත් අය සම්මුඛ පරීක්ෂණයකට භාජනය කර සුදුස්සන් තෝරාගනු ලැබේ. සම්මුඛ පරීක්ෂණයේ දී ලකුණු ලබා දෙනු නොලබන අතර සුදුසුකම් පමණක් පරීක්ෂා කරනු ලැබේ. සුදුසුකම් ලැබීම සඳහා එක් එක් ප්‍රශ්න පත්‍රයට අවම වශයෙන් 40%ක ලකුණු ප්‍රමාණයක් ලබාගත යුතුය. ලිඛිත පරීක්ෂණයට අදාල විෂයයන් හා විෂය නිර්දේශය පහත පරිදි වේ. :—

1. කාර්මික දැනුම (පැය 01කි)
   වාත්තු, යන්ත්‍රනය, වැද්දුම්කරණය, පෑස්සුම්කරණය, මෝටර් කාර්මික, වඩු කාර්මික හා නඩත්තු යන ක්ෂේත්‍ර වලට අදාලව බඳවාගැනීමේ සුදුසුකම් ලෙස දක්වා ඇති ඩිප්ලෝමා හෝ සමාන සහතිකලාභියෙකු සතුව පැවතිය යුතු තාක්‍ෂණික දැනුම මට්ටම පරීක්ෂා කරන ආකාරයේ ප්‍රශ්න ඇතුලත් වේ.

2. සාමාන්‍ය දැනුම හා බුද්ධි පරීක්‍ෂණය (පැය 01 කි.)

   * ශ්‍රී ලංකාවේ භූ විෂමතා, ඉතිහාසය, දේශපාලනය, ක්‍රීඩා හා මෑත කාලයේ සිදු වූ වැදගත් සිදුවීම් (ජාත්‍යන්තරයේ ලබාගත් ජයග්‍රහණයන්ද ඇතුළුව) සහ,

   * ලෝකයේ සිදු වූ වැදගත් සිදුවීම්, භූගෝලීය අනුව සිදුවන බෙදීම්, ප්‍රධාන නගරයන්, ජාත්‍යන්තර සංවිධාන හා ඒවායේ කාර්යය භාරයන්,

   * අවබෝධ කරගැනීමේ ශක්තිය, තර්කානුකූල විචාර බුද්ධිය, විඥාන ශක්තිය, ක්ෂණිකව නිවැරදි තීරණ ගැනීමේ හැකියාව, සංඛ්‍යානමය හා ගණිතමය ගැටළු විසඳීමේ හැකියාව, භාෂා ඛණ්ඩ, වගු, පින්තූර, ප්‍රස්ථාර උපයෝගී කර ගැනීම හා පරීක්ෂා කිරීම යනාදිය පිළිබඳව දැනුම පරීක්ෂා කෙරේ.

08. *රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම.*—රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය විසින් 2007.04.28 දින නිකුත් කර ඇති රා. ප. ච. අංක 07/2007 අනුව 2007.07.01 දිනට පසුව සේවයට බැඳෙන සියලුම රාජ්‍ය නිලධාරීන් සේවයට බැඳුණු රාජ්‍ය භාෂාවට අතිරේක වශයෙන් අනෙක් රාජ්‍ය භාෂාව පිළිබඳව ප්‍රවීණතාවක් සේවයට බැඳී වසර 05ක් තුළ ලබාගත යුතු ය.

09. සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :

09.1 මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු අනත්දරු/වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් ගෙවිය යුතු ය.

09.2 තෝරාගනු ලබන අපේක්ෂකයින් ආයතන සංග්‍රහයේ විධිවිධාන වලට ද, මුදල් රෙගුලාසි වලට ද, රජය හෝ රේඛීය අමාත්‍යාංශය හා රජයේ කර්මාන්තශාලාව විසින් නිකුත් කරනු ලබන නීති හා රෙගුලාසි වලට ද යටත් විය යුතු ය.

09.3 ආයතන සංග්‍රහයේ II පරිච්ඡේදයේ 10 සිට 12 දක්වා ඡේදවල විධිවිධාන ද අදාල වේ.

09.4 පත්වීම තුන් අවුරුදු පරිවාස කාලයකට යටත් වේ.

10. රාජ්‍ය හා පළාත් රාජ්‍ය සේවාවන් හි නියුතු අයදුම්කරුවන් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් මෙම අයදුම්පත ඉදිරිපත් කළ යුතුය.

ඩබ්. එම්. කේ. පී. එස්. ආර්. ප්‍රනාන්දු,
කර්මාන්තශාලීය ඉංජිනේරු.

රජයේ කර්මාන්තශාලාව,
කොලොන්නාව.

අයදුම්පත්‍රය

**රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුවේ යාන්ත්‍රික අධිකාරී II 'ආ' තනතුර සඳහා ඉල්ලුම් පත්‍රය**

(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා පමණයි.)

01. (i) මුලකුරු සමඟ අගට යෙදෙන නම :————.
(ii) මුලකුරු වලින් හැඳින්වෙන නම් :————.
(iii) මුලකුරු සමඟ නම (ඉංග්‍රීසියෙන්) :————.

02. ලිපිනය හා දුරකථන අංක :
(i) කාර්යාලීය ලිපිනය :————.
දුරකථන අංකය :————.
(ii) පෞද්ගලික ලිපිනය :————.
(iii) දුරකථන අංකය :————.
(ලිපිනයේ හෝ දුරකථන අංකයේ වෙනසක් වුවහොත්, වහාම දැන්විය යුතු ය.)

03. උපන් දිනය හා ස්ථානය :————.

04. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස :
අවුරුදු :————. මාස :————. දින :————.

05. ජාතික හැඳුනුම්පත් අංකය :————. නිකුත් කළ දිනය :————.

06. ඔබ ශ්‍රී ලංකා පුරවැසියෙක් ද? :————.

07. (i) ස්ත්‍රී/පුරුෂ භාවය :————.
(ii) විවාහක/අවිවාහක/වැන්දඹු ද යන වග :————.

08. අධ්‍යාපන සුදුසුකම් :

| *විභාගය/ ඩිප්ලෝමාව* | *වර්ෂය* | *පෙනී සිටි විෂයයන්* | *සාමාර්ථය* | *ආයතනයේ/ විශ්ව විද්‍යාලයේ නම* |
|---|---|---|---|---|
| | | | | |

09. වෘත්තීය සුදුසුකම් :

| විභාගය/ ඩිප්ලෝමාව | වර්ෂය | පෙනී සිටි විෂයයන් | සාමාර්ථය | ආයතනයේ/ විශ්ව විද්‍යාලයේ නම |
|---|---|---|---|---|
| | | | | |

10. වෙනත් සුදුසුකම් :————.

11. ජන වර්ගය : (කොටුව තුල නියමිත අංකය සටහන් කරන්න.)

| | | |
|---|---|---|
| සිංහල | 1 | ☐ |
| ශ්‍රී ලංකා දෙමළ | 2 | |
| ශ්‍රී ලංකා මුස්ලිම් | 3 | |
| ඉන්දියානු සම්භවයක් ඇති | 4 | |
| වෙනත් | 5 | |

මෙම අයදුම්පතෙහි මා විසින් සපයා තිබෙන තොරතුරු සත්‍ය හා නිවැරදි බව මෙයින් සහතික කරමි. මෙහි ඇතුලත් තොරතුරුවලින් කිසිවක් අසත්‍ය හෝ නිවැරදි නොවන බව මා තෝරා ගැනීමට පෙර දැනගතහොත් මා නුසුදුස්සෙකු වීමට යටත් වන බවත්, පත් කිරීමෙන් පසු ඒ බව දැනගතහොත් කිසිදු වන්දියක් නොලබා සේවයෙන් පහ කිරීමට යටත් වන බවත් මම දනිමි.

————.
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

(මෙම කොටස අදාළ වනුයේ රජයේ රැකියාවක නියුක්ත වූවන්ට සහ පුහුණුවන්නන්ට පමණි.)

***දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ සහතිකය***

රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුවේ යාන්ත්‍රික අධිකාරී II 'ආ' තනතුර සඳහා ඉල්ලුම් කර සිටින ....................අමාත්‍යාංශයේ/ දෙපාර්තමේන්තුවේ/ආයතනයේ සේවය කරන ....................... මයා දැනට ................. තනතුරේ සේවය කරන/පුහුණුව ලබන බවද, ඔහුගේ වැඩ සහ හැසිරීම සතුටුදායක බවද සහතික කරමි. ඔහු මෙම තනතුර සඳහා තෝරා ගතහොත් සේවයෙන් නිදහස් කල හැකිය/නොහැකිය.

————.
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන.

දිනය :————.
නිල මුද්‍රාව :————.

02-271

---

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

## සංශෝධනය කිරීමයි

### යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය

කාර්මික අධ්‍යාපන සේවයේ III පන්තියේ (විශේෂ සේවක සංඛ්‍යාවේ) තනතුරු සඳහා බඳවා ගැනීමේ තරග විභාගය - 2011

2011 ජනවාරි මස 14 වැනි දින අංක 1689 දරන රජයේ ගැසට් පත්‍රයේ I වැනි කොටස (IIඅ) වැනි ඡේදය - පළකිරීම් හි විභාග, විභාග ප්‍රතිඵල ආදිය සඳහන් කොටසේ කාර්මික අධ්‍යාපන සේවයේ III පන්තියේ (විශේෂ සේවක සංඛ්‍යාවේ) තනතුරු සඳහා බඳවා ගැනීමේ තරග විභාගය සඳහා අයදුම්පත් කැඳවීමේ නිවේදනයෙහි,

අංක 04 (ඈ) පහත සඳහන් පරිදි සංශෝධනය විය යුතු ය.

ඉල්ලුම් පත්‍ර භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 21ට නොඅඩු හා 45ට නොවැඩි විය යුතුය. දැනටමත් රාජ්‍ය සේවයේ නියුක්ත වූවන් සඳහා උපරිම වයස් සීමාව බලපානු නොලැබේ.

අංක 05. අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් යටතේ දක්වා ඇති,
05.1, 05.2, 05.3, 05.4, 05.5, 05.6, 05.7 හා 05.12 හි සඳහන් තනතුරු සඳහා ඒ ඒ තනතුරුවලට අදාල ක්ෂේත්‍රය පිළිබඳ පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබාගත් උපාධියක් සහිතව ඉගැන්වීමේ/අදාළ කර්මාන්ත ක්ෂේත්‍රයේ වසර තුනක පළපුරුද්දක් ලබා තිබීම ද සුදුසුකමක් වශයෙන් ඇතුළත් විය යුතු ය.

05.11 (i) පහත සඳහන් පරිදි සංශෝධනය විය යුතුය. :—

ව්‍යාපාර පරිපාලනය හෝ රාජ්‍ය පරිපාලනය හෝ වාණිජ්‍ය විද්‍යාව හෝ පිළිබඳ පිළිගත් විශ්ව විද්‍යාලයකින් උපාධිය ලබා තිබීම.

සු. සෝ. හේවාපතිරණ,
ලේකම්,
යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය.

2011 ජනවාරි මස 26 වැනි දින,
යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය
නිපුණතා පියස,
අංක 354/2, ඇල්විටිගල මාවත,
කොළඹ 05.

02-209

## සෞඛ්‍ය අමාත්‍යාංශය

### ප්‍රාථමික ශ්‍රේණියේ වෛද්‍ය නිලධාරීන් සහ දන්ත ශල්‍ය වෛද්‍ය නිලධාරීන් සඳහා වන දෙපාර්තමේන්තු විභාගය - 2011 මාර්තු

1991.05.17 වැනි දින හා අංක 662/11 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද සෞඛ්‍ය සේවයේ වෛද්‍ය නිලධාරීන් පිළිබඳ ව්‍යවස්ථා සංග්‍රහයේ 07 වැනි වගන්තියේ සඳහන් පරිදි ප්‍රාථමික ශ්‍රේණියේ වෛද්‍ය නිලධාරීන් II ශ්‍රේණියට උසස් කිරීමට පෙර සහ දන්ත ශල්‍ය වෛද්‍ය නිලධාරීන් ස්ථිර කිරීමට පෙර සමත් විය යුතු වන දෙපාර්තමේන්තු විභාගය 2011 මාර්තු මස 27 වැනි දින සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යවලින් පවත්වනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ. විභාගය පවත්වනු ලබන ස්ථානය හා කාල සටහන ප්‍රවේශ පත්‍රයේ සඳහන් කරනු ඇත.

02. *සුදුසුකම් :*
මෙම විභාගයට අයදුම් කළ හැක්කේ ප්‍රාථමික ශ්‍රේණියේ වෛද්‍ය නිලධාරීන් සහ දන්ත ශල්‍ය වෛද්‍ය නිලධාරීන්ගෙන් මෙතෙක් අදාළ විභාගය සම්පූර්ණ කර නොමැති නිලධාරීන්ට පමණි.

03. *අයදුම්පත් :*

මෙම චක්‍රලේඛයේ අගට දක්වා ඇති ආකෘතිය අනුව අයදුම්කරුවන් විසින් සකස් කරගත යුතු අයදුම්පත් ආයතන ප්‍රධානියා මගින් කොළඹ 10, අංක 385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත, සෞඛ්‍ය අමාත්‍යාංශයේ "සුවසිරිපාය" ගොඩනැගිල්ලේ අධ්‍යක්ෂ (විභාග) වෙත 2011 මාර්තු මස 13 වැනි දින හෝ ඊට පෙර ලැබෙන සේ ලේඛණගත තැපෑලෙන් එවිය යුතුය. සෑම අයදුම්පත්‍රයක්ම දක්වා ඇති තොරතුරු නිවැරදි බව කොට්ඨාස ප්‍රධානියා විසින් සහතික කර තිබිය යුතුය. තම අයදුම්පත සමග ලිපිනය ලියන ලද රු. 30 ක් වටිනා මුද්දර ඇලවූ 9" x 4" ප්‍රමාණයේ ලියුම් කවරයක්ද එවිය යුතුය. (මෙහි කැමති පරිදි රාජකාරි ලිපිනය හෝ පෞද්ගලික ලිපිනය ලිවිය හැකිය.) ප්‍රමාද වී ලැබෙන අයදුම්පත්, අසම්පූර්ණ හෝ වැරදි සහිත වන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

*සැ. යු :* ආදර්ශ අයදුම්පතෙහි ආකෘතියට අනුව, අයදුම්පත්‍රය A4 වර්ගයේ කඩදාසියක පළමු පිටුවේ අංක 1 සිට 4 (ඇ) දක්වාත් දෙවන පිටුවේ අංක 4 (ඈ) සිට අංක 8 දක්වාත් සකස් කළ යුතුය. ඉහත ආකෘතියට අනුකූල නොවන සහ අසම්පූර්ණ සියළුම අයදුම්පත්‍ර නැවත දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

04. *විභාග ගාස්තු :*

(i) විභාගයට පළමුවන වතාවට ඉදිරිපත් වන අයදුම්කරුවන් විභාග ගාස්තුවලින් නිදහස් කරනු ලැබේ.

(ii) කිසිදු කරුණක් මත මෙසේ ගෙවන ලද විභාග ගාස්තු වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමක් හෝ ආපසු ගෙවීමක් සිදුකරනු නොලැබේ. අනෙකුත් අයදුම්කරුවන් එක් විෂයකට රු. 25 බැගින් අවලංගු නොකළ මුද්දර ඉල්ලුම් පත්‍රයේ අලවා තමන්ගේ අත්සන සහ දිනය යොදා ඒවා නිසිලෙස අවලංගු කළ යුතුය.

05. *විභාගයට ඇතුලත් කර ගැනීම :*

(i) පිළිගත් අයදුම්පත් සඳහා අපේක්ෂකයින්ට ප්‍රවේශපත් නිකුත් කරනු ලැබේ. එම ප්‍රවේශපත් නියමිත පරිදි සම්පූර්ණ කර විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය.

(ii) විභාග අපේක්ෂක/අපේක්ෂිකාවන් විසින් විභාග ශාලාව තුළ දී විභාග ශාලාධිපතිට ස්වකීය අනන්‍යතාවය තහවුරු කළ යුතුය. ඒ සඳහා පහත සඳහන් ලියකියවිලි අතුරින් එකක් ඉදිරිපත් කළ යුතුය.

(අ) පුද්ගල හැඳුනුම්පත්‍රය;
(ආ) දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරනු ලබන හැඳුනුම්පත්‍රය;
(ඇ) රියදුරු බලපත්‍රය;
(ඈ) ගමන් බලපත්‍රය;

(iii) කිසියම් නොවැළැක්විය හැකි හේතුවක් මත විභාග ප්‍රවේශ පත්‍රය නොලැබුණේ නම් සෞඛ්‍ය අමාත්‍යාංශයේ වෙබ් අඩවිය පරීක්ෂාකර මධ්‍යස්ථානය සහ විභාග අංකය සොයාගත හැකිය. එසේ ඔබේ නමට අදාළ විභාග අංකය හා විභාග මධ්‍යස්ථානය සොයා ගත්තේ නම් ඔබේ ආසන්නතම ජ්‍යෙෂ්ඨ නිලධාරියා වෙතින් අත්සන සහතික කරන ලද ලිපියක්ද සමග වෙබ් අඩවියේ සඳහන්ව තිබූ විභාග මධ්‍යස්ථානයට පැමිණ ඔබේ අනන්‍යතාවය තහවුරු කර විභාගයට පෙනී සිටිය හැකිය.

(වෙබ් අඩවිය-WWW. health. gov.lk)

06. *විභාග පරිපාටිය :*
මෙම විභාගය ලිඛිත ප්‍රශ්න පත්‍ර තුනකින් සහ සිංහල/දෙමළ වාචික පරීක්ෂණයකින් සමන්විතය. එක් එක් කොටසක් සඳහා ලකුණු 100 බැගින් වෙන් කෙරේ. සමත් වීම සඳහා එක් කොටසකට අවම වශයෙන් ලකුණු 50 ක් ලබා ගත යුතුය. එක් වරකදී හෝ කිහිපවරකදී කොටස් වශයෙන් පෙනී සිට විභාගය සම්පූර්ණ කළ හැකිය. නිළධාරීන් විභාගයට පෙනී සිටින පළමු අවස්ථාවේ දී අදාළ සියළුම විෂයන්ට පෙනී සිටිය යුතුය.

07. *විභාග විෂය නිර්දේශ මාලාව :*

07.1 ලිඛිත විභාගය :

07.1.1 ආයතන සංග්‍රහය :
කාලය පැය 02 යි, ප්‍රශ්න 08 කින් ප්‍රශ්න 05 කට පිළිතුරු සැපයිය යුතුය.

විෂය නිර්දේශය :

(i) ආයතන සංග්‍රහය

(අ) I කොටස — II, III, V, VI, VII, VIII, IX, XI, XII, XIII, XV, XXIV, XXV, XXVII, XXVIII, XXX, XXXI, XXXII, XXXIII පරිච්ඡේදයන්
(ආ) II කොටස — XLVII සහ XLVIII වැනි පරිච්ඡේදයන්

(ii) සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ සාමාන්‍ය රෙගුලාසි

(iii) රාජ්‍යසේවා කොමිෂන් සභාවේ සංයුතිය හා කාර්යභාරය

7.1.2 රෝහල් සහ බෙහෙත් ශාලා පරිපාලනය
කාලය පැය 1 1/2 යි. ප්‍රශ්න 07 කින් ප්‍රශ්න 04 කට පිළිතුරු සැපයිය යුතුය.
විෂය නිර්දේශය :
සෞඛ්‍ය සේවා සංග්‍රහය
(i) වැනි කොටස - වෛද්‍ය සේවා
(ii) වැනි කොටස - රසායනාගාර සේවා

07.1.3 ගිණුම් :
කාලය පැය 02 යි. ප්‍රශ්න 07 කින් ප්‍රශ්න 04 කට පිළිතුරු සැපයිය යුතුය.

විෂයය නිර්දේශය
(i) රජයේ මුදල් රෙගුලාසි
පරිච්ඡේද I - සියළුම වගන්ති
පරිච්ඡේද II - සියළුම වගන්ති
පරිච්ඡේද III - සියළුම වගන්ති
පරිච්ඡේද IV - සියළුම වගන්ති
පරිච්ඡේද V - 1, 2, 3, 4 සහ 6 වගන්ති
පරිච්ඡේද VI - සියළුම වගන්ති
පරිච්ඡේද VII - 1, 2, 3, 4 සහ 6 වගන්ති

(ii) සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ ගබඩා ගිණුම් තැබීම පිළිබඳ රෙගුලාසි
(iii) සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ කාර්ය සංවිධාන සංග්‍රහයේ මුදල් පිළිබඳ ඡේදයන්
(iv) සෞඛ්‍ය වෛද්‍ය නිලධාරියෙකුගේ දෛනික රාජකාරිවලට අදාළ වන මුදල් රෙගුලාසි

07.2 සිංහල/දෙමළ වාචික පරීක්ෂණය :
සිංහල/දෙමළ භාෂා ප්‍රවීනතාවය මැනීම සඳහා දෙපාර්තමේන්තුවේ මාණ්ඩලික නිලධාරීන් විසින් කොළඹ දී පවත්වනු ලබන වාචික පරීක්ෂණයකි. තමන්ගේ සාමාන්‍ය රාජකාරි කටයුතු කරගෙනයාමේ දී පැන නගින කරුණු සම්බන්ධයෙන් සිංහලෙන් හෝ දෙමළෙන් සාකච්ඡා කිරීමට නිලධාරීන්ට ඇති හැකියාව පරීක්ෂා කරනු ලැබේ.

08. කරුණාකර මෙම චක්‍රලේඛයේ අඩංගු දෑ ඔබ කොට්ඨාසයේ/විශේෂිත ව්‍යාපාරයේ/ආයතනයේ සේවයෙහි නියුතු අදාල නිලධාරීන්ගේ දැනගැනීමට සලස්වන්න. මෙම තොරතුරු www.health.gov.lk වෙබ් අඩවියේ ද ඇතුලත් කර ඇත.

එච්. එස්. ප්‍රනාන්දු,
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (පාලන 02),
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙනුවට.

2011 ජනවාරි මස 27 වැනි දින.
සෞඛ්‍ය අමාත්‍යාංශය,
"සුවසිරිපාය",
අංක 385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.

(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා)

**ආදර්ශ අයදුම්පත**

***ප්‍රාථමික ශ්‍රේණියේ වෛද්‍ය නිලධාරීන් සහ දන්ත ශල්‍ය වෛද්‍ය නිලධාරීන් සඳහා වන දෙපාර්තමේන්තු විභාගය - 2011 මාර්තු***

01 (අ) (i) අයදුම්කරුගේ නම (සිංහලෙන් හෝ දෙමළෙන් මුලකුරු අගට යොදා ලියන්න) :—————.

(ii) අයදුම්කරුගේ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින් මුලකුරු අගට යොදා ලියන්න) :

| | | | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | | | | | | | | | |

(iii) මුලකුරු වලින් හැඳින්වෙන නම් (සිංහලෙන් හෝ දෙමළෙන්) :—————.

(iv) මුලකුරු වලින් හැඳින්වෙන නම් (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :

| | | | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | | | | | | | | | |

(ආ)(i) නිළ නාමය (වෛද්‍ය නිලධාරී/දන්ත ශල්‍ය වෛද්‍ය නිලධාරී) :—————.
(ii) සීමාවාසික පත්වීම ලද දිනය :—————.
(iii) ප්‍රාථමික ශ්‍රේණියට පත්වීම ලද දිනය :—————.

02. ඔබ මෙවර විභාගයට පෙනී සිටීමට අපේක්ෂා කරන විෂයන් ඉදිරියේ ඇති කොටුව තුළ (✓) ලකුණ යොදන්න. පෙනී නොසිටින්නේ නම් (X) ලකුණ යොදන්න.

| | | | | | |
|---|---|---|---|---|---|
| රෝහල් සහ බෙහෙත් ශාලා පරිපාලනය | | ආයතන සංග්‍රහය | | ගිණුම් | |
| සිංහල වාචික | | දෙමළ වාචික | | | |

03. විභාගයට පෙනී සිටින මාධ්‍යය - (සිංහල/ඉංග්‍රීසි/දෙමළ) :—————.

04. (අ) දැන් සේවය කරන ආයතනය :—————.

(ආ) එය අයත් දිස්ත්‍රික්කය :—————.

(ඇ) පහත දක්වා ඇති මධ්‍යස්ථාන අතුරින් විභාගයට පෙනී සිටීමට කැමැති විභාග මධ්‍යස්ථානයට අදාල කොටුවේ (✓) හරි ලකුණ යොදන්න. (දෙපාර්තමේන්තුවේ අවශ්‍යතාවයන් මත හෝ කිසියම් විභාග මධ්‍යස්ථානයකට ප්‍රමාණවත් අයදුම්කරුවන් සංඛ්‍යාවක් නොමැති නම් හෝ දක්වා ඇති මධ්‍යස්ථාන එකක් හෝ කිහිපයක් අවලංගු කරනු ලබන අතර එකී මධ්‍යස්ථානයට අයදුම්කරනු ලැබූ අයදුම්කරුවන් ආසන්නතම විභාග මධ්‍යස්ථානයට හෝ සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් තීරණය කරනු ලබන වෙනත් විභාග මධ්‍යස්ථානයකට අනුයුක්ත කරනු ලැබේ.)

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| කොළඹ | | කඳාන | | හම්බන්තොට | | අම්පාර | |
| කළුතර | | ගාල්ල | | බදුල්ල | | වව්නියා | |
| කුරුණෑගල | | අනුරාධපුර | | රත්නපුර | | | |
| මහනුවර | | මඩකලපුව | | යාපනය | | | |

(ඈ) විභාග ප්‍රවේශ පත්‍රය එවීම සඳහා පැහැදිලිව ලිපිනය ලියන ලද 9" x 4" ප්‍රමාණයේ රුපියල් 30 ක මුද්දර ඇලවූ ලියුම් කවරයක් අයදුම්පත්‍රයකට අමුණන ලද්දේ ද? :—————.

(ඉ) (i) තැපැල් ලිපිනය (සිංහලෙන් හෝ දෙමළෙන්) :—————.
(ii) තැපැල් ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :—————.

05. (අ) මීට ප්‍රථම මෙම විභාගයට පෙනී සිටියේ ද ? :—————.
(ආ) එසේ පෙනී සිට ඇත්නම් මෙවර වෙනුවෙන් මුද්දර අලවා තිබේද? :—————.

මුද්දර කොටුව

06. අයදුම්කරුගේ සහතිකය :
මගේ දැනුම හා විශ්වාසය පරිදි —

(i) මෙම ඉල්ලුම් පත්‍රයේ සඳහන් කර ඇති තොරතුරු සත්‍ය බවත් මෙම විභාගයට මා පෙනී සිටින්නේ ප්‍රථම වතාවට බැවින් විභාග ගාස්තු ගෙවීම අනවශ්‍ය බවත් ප්‍රථම වතාවට නොවන බැවින් රු.... ක් වටිනා මුද්දර අලවා ඇති බවත් මෙම ඉල්ලුම් පත්‍රයට මා විසින් අලවා ඇති මුද්දර අවලංගු කිරීමට පෙර වලංගු වූ පාවිච්චි නොකරන ලද මුද්දර බවත් ප්‍රකාශ කරමි.

(ii) සෞඛ්‍ය දෙපාර්තමේන්තුව විසින් විභාග පිළිබඳව පනවා ඇති නීතිරීතිවලට එකඟව ක්‍රියාකිරීමටත් මෙම විභාගය පිළිබඳ ව්‍යවස්ථාව අනුව මා නුසුදුස්සකු බව පෙනී ගියහොත්, මාගේ

විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ගනු ලබන කවර හෝ තීරණයකට මම එකඟවන බවත් සහතික කරමි.

________,
අයදුම්කරුගේ අත්සන

දිනය :————.

07. ආයතන ප්‍රධානියාගේ සහතිකය :

.......................... මහතා/මහත්මිය/මෙනවිය මෙම ආයතනයේ සේවයේ නියුතු වෛද්‍ය නිලධාරියෙකු/දන්ත ශල්‍ය වෛද්‍ය නිලධාරියෙකු වන අතර, අයදුම්පත්‍රයෙහි දී තිබෙන තොරතුරු අයදුම්කරුගේ පෞද්ගලික ලිපි ගොනුවේ ඇති තොරතුරු අනුව නිවැරැදි බවත්, මෙම විභාගයට පෙනී සිටින්නේ ප්‍රථම වතාවට වන/නොවන බවටද රු.................. ක් වටිනා මුද්දර මෙම මුද්දර ඉල්ලුම් පත්‍රයට අලවා ඇති බවද/මුද්දර ඇලවීමට අනවශ්‍ය බවටද මා ඉදිරිපිටදී අත්සන් කළ බවද සහතික කරමි.

________,
ආයතන ප්‍රධානියාගේ අත්සන.

දිනය :————.

08. විමධ්‍යගත කොට්ඨාස/විශේෂිත ව්‍යාපාර ප්‍රධානියාගේ සහතිකය :

.......................... මහතා/මහත්මිය/මෙනවිය මෙම ආයතනයේ සේවයේ නියුතු වෛද්‍ය නිලධාරියෙකු/දන්ත ශල්‍ය වෛද්‍ය නිලධාරියෙකු වශයෙන් මගේ කොට්ඨාසයේ/ව්‍යාපාරයේ සේවය කරන බවත්, අයදුම්පත්‍රයෙහි දී තිබෙන තොරතුරු අයදුම්කරුගේ පෞද්ගලික ලිපි ගොනුවේ ඇති තොරතුරු අනුව නිවැරැදි බවත්, මෙම විභාගයට පෙනී සිටීමට ඔහුට/ඇයට සුදුසුකම් ඇති බවත් සහතික කරමි.

________,
විමධ්‍යගත කොට්ඨාස/විශේෂිත
ව්‍යාපාර ප්‍රධානියාගේ අත්සන.
(රබර් මුද්‍රාව තැබිය යුතුය).

දිනය :————.

(අනවශ්‍ය කොටස් කපා හරින්න)

02-237

---

**යෞවන කටයුතු සහ නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය**

කාර්මික අධ්‍යාපන සහ පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව

**තාක්ෂණ විද්‍යාලයන්හි පැවැත්වෙන ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම් 5 (NVQ Level 5) ඩිප්ලෝමා මට්ටමේ පාඨමාලා සඳහා සිසුන් ඇතුලත් කර ගැනීම - 2011**

මෙම නිවේදනයේ සඳහන් තාක්ෂණ විද්‍යාලවල පැවැත්වෙන පාඨමාලා සඳහා සුදුසුකම් ඇති අපේක්ෂකයින්ගෙන් අයැදුම්පත් කැඳවනු ලැබේ. අයැදුම්කරුවන් අතුරින් ඔවුන්ගේ සුදුසුකම් හා කුසලතාවයන් සැලකිල්ලට ගෙන පාඨමාලා සඳහා අවශ්‍ය ප්‍රමාණයට සිසුන් බඳවා ගනු ලැබේ.

02. දැන්වීමේ දක්වා ඇති "ආදර්ශ අයදුම්පත්‍රයට" අනුව 13" x 8" ප්‍රමාණයේ කඩදාසියක අදාල අයැදුම්පත්, අයැදුම්කරුවන් විසින්ම සකස් කර ගත යුතුවේ. සෑම අයැදුම්පත්‍රයක්ම, ආදර්ශ අයැදුම්පතෙහි 14 වන අංකය යටතේ සඳහන් වන පරිදි වලංගු රු. 10 ක මුද්දරයක් අලවා තමන්ගේ සුපුරුදු අත්සන යොදා අවලංගු කළ යුතුය. නිසිලෙස සම්පූර්ණ කරන ලද අයැදුම්පත් 2011.03.05 වැනි දිනට හෝ ඊට පෙර අදාල තාක්ෂණ විද්‍යාලයේ අධ්‍යක්ෂ වෙත ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

03. කවරයෙහි වම්පස ඉහළ කෙළවරෙහි ඉල්ලුම් කරන පාඨමාලාවේ නම හා සංකේත අංකය යොදන්න.

04. නියමිත දිනට පසුව ලැබෙන අයැදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

05. අර්ධ කාල/සන්ධ්‍යා කාල පාඨමාලා සඳහා අධ්‍යයන වර්ෂයකට රු. 2,000 ක් අයකරනු ලැබේ.

06. සියළුම පාඨමාලා ඉංග්‍රීසි මාධ්‍යයෙන් පවත්වනු ලැබේ.

07. පාඨමාලාවල ස්වභාවය :- ඒ ඒ පාඨමාලා සඳහා සුදුසුකම් හා පැවැත්වෙන තාක්ෂණ විද්‍යාල යනාදිය මෙම දැන්වීමේ දක්වා ඇති පාඨමාලා පිළිබඳ ලේඛණයෙහි සඳහන් කර ඇති අතර, සියළුම අයැදුම්කරුවන්ගේ අවධානය එයට යොමු කරවනු ලැබේ. ඒ ඒ තාක්ෂණ විද්‍යාලයේ ලිපිනය තාක්ෂණ විද්‍යාල ලැයිස්තුවේ සඳහන් වේ.

08. මෙම තාක්ෂණ විද්‍යාලයන්හි පාඨමාලා හැදෑරීමට ඉල්ලුම් කරන ඉල්ලුම්කරුවකු/ඉල්ලුම්කාරියක—

(i) මනා චරිතයකින් යුක්ත විය යුතුය.
(ii) ශ්‍රී ලංකා පුරවැසියකු විය යුතුය.
(iii) ඉල්ලුම්පත්‍ර ඉදිරිපත් කරන අවස්ථාවේ දී ඇතුලත්වීම සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරා තිබිය යුතුය.

09. සුදුස්සන් තෝරාගනු ලබන්නේ අභියෝග්‍යතා පරීක්ෂණයක හා සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මතය.

10. ලිපිලේඛන කිසිවක් හෝ ඒවායේ පිටපත් හෝ ඉල්ලුම් පත්‍රය සමග ඉදිරිපත් නොකළ යුතුය. තේරීම් පරීක්ෂණයේ දී අවශ්‍ය හා පිළිගත හැකි ලිපි ලේඛණ ඉදිරිපත් කර යෝග්‍යතාවය ඔප්පු කිරීමට නොහැකි වන අයදුම්කරුවන් නුසුදුස්සන් වනු ඇත.

11. *පූර්ණ කාල දිවා පාඨමාලා හදාරණ සිසුන් සඳහා තම පවුලේ ආර්ථික තත්වය මත විද්‍යාලයේ පන්තිවලට සහභාගී වන සෑම දිනකටම රු. 50 ක දීමනාවක්, මසකට රු. 1,000 ක උපරිමයකට යටත්ව ගෙවනු ලැබේ.

*පූර්ණ කාල දිවා පාඨමාලා හදාරණ අඩු ආදායම් ලබන තෝරා ගත් ශිෂ්‍ය ශිෂ්‍යාවන් සඳහා රු. 2,500 බැගින් වූ වාර්ෂික ශිෂ්‍යාධාරයක් ගෙවනු ලැබේ.

12. සිය ලිපි ලේඛණවල සත්‍යතාවය පිළිබඳව ඉල්ලුම්කරු සම්පූර්ණයෙන්ම වගකිව යුතුය. වංචනික හෝ වෙනස්කිරීම් සහිත ලිපිලේඛණ ඉදිරිපත් කරන හෝ සඳහන් කරුණු සනාථ වන සේ ලිපි ලේඛන ඉදිරිපත් නොකරන ඉල්ලුම්කරුවන්ට විරුද්ධව තදින් ක්‍රියාකරනු ලැබේ.

13. මෙම ගැසට් පත්‍රයෙහි සඳහන් තාක්ෂණ විද්‍යාලවල 2011 අධ්‍යයන වර්ෂයෙහි පැවැත්වීමට නියමිත පාඨමාලා සියල්ල පැවැත්වීම හෝ කිහිපයක් පැවැත්වීම කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ අභිමතය පරිදි වේ.

ඕනෑම අයදුම්කරුවෙකුට තමන් කැමති ඕනෑම පාඨමාලාවකට වෙන වෙනම ඉල්ලුම් පත්‍රයක් බැගින් ඉදිරිපත් කළ හැක.

ආචාර්ය චිත්‍රාල් අඹවත්ත,
අධ්‍යක්ෂ ජනරාල්,
කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව.

තැ. පෙ. 557,
ඕල්කොට් මාවත, කොළඹ 10.
www.dtet.gov.lk

*ආදර්ශ අයදුම්පත්‍රය*

*තාක්ෂණ විද්‍යාලයන්හි පැවැත්වෙන ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම් 5 (NVQ Level 5)*
*ඩිප්ලෝමා මට්ටමේ පාඨමාලා සඳහා ඇතුලත් කර ගැනීමේ අයදුම්පත්‍රය - 2011 අධ්‍යයන වසර*

කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා පමණි

01. ඉල්ලුම් කරනු ලබන තාක්ෂණ විද්‍යාලයේ නම :————.
02. පාඨමාලාවේ නම :————. දිවා/සන්ධ්‍යා/අර්ධ කාලීන
03. පාඨමාලා සංකේත අංකය :————.
04. අයදුම්කරුගේ මුලකුරු සමග නම :————.
05. මුලකුරුවලින් හැඳින්වෙන නම් :————.
06. ස්ථිර ලිපිනය :————.
07. සම්බන්ධ කර ගත හැකි දුරකථන අංකය :————.
08. ජාතික හැඳුනුම්පත් අංකය :————.
09. දිස්ත්‍රික්කය :————. ඡන්ද කොට්ඨාසය :————.
: ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය :————.
: ග්‍රාම නිලධාරි කොට්ඨාසය :————.
10. උපන් දිනය :————.
2011.01.01 දිනට වයස
අවුරුදු :————. මාස :————. දින :————.
11. ස්ත්‍රී/පුරුෂ භාවය :————.
12. ඇතුලත්වීමේ සුදුසුකම් : *ගැසට් නිවේදනයේ දක්වා ඇති පරිදි ඔබ ලබා ඇති සුදුසුකම් පහත සඳහන් අදාළ කොටුවේ සඳහන් කරන්න.* :—

| පාඨමාලාවට ඇතුලත්විමේ සුදුසුකම්/සහතික පිළිබඳ විස්තර | | | | | |
|---|---|---|---|---|---|
| *ලබා ඇති සහතිකයේ නම* | *NVQ මට්ටම* | *පාඨමාලාව හැදෑරු ආයතනයේ නම* | *අදාළ සේවා පළපුරුද්ද ඇත්නම් ඒ පිළිබඳ විස්තර කෙටියෙන්* | *සේවා කාලය* *අවුරුදු* | *මාස* |
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |

13. (අ) අධ්‍යාපන සුදුසුකම් :- අ.පො.ස. (සා.පෙළ) (දෙවරකට නොවැඩි වාර ගණනක දී)

| *විභාග අංකය* | *විභාගයට පෙනී සිටි වර්ෂය* | *විෂයයන්* | *ලබාගත් ශ්‍රේණිය* |
|---|---|---|---|
| | | | |

(ආ) අධ්‍යාපන සුදුසුකම් - අ.පො.ස. (උ. පෙළ)

| *විභාග අංකය* | *විභාගයට පෙනී සිටි වර්ෂය* | *විෂයයන්* | *ලබාගත් ශ්‍රේණිය* |
|---|---|---|---|
| | | | |

14. අයදුම්කරුගේ ප්‍රකාශය

මවිසින් මෙහි සඳහන් කර ඇති තොරතුරු මා දන්නා තරමින් නිවැරදි බවත්, ඉල්ලුම්කොට ඇති පාඨමාලාවට අවශ්‍ය සුදුසුකම් මා සපුරා ඇති බවත්, මෙයින් සහතික කරමි. තවද තාක්ෂණ විද්‍යාලයට සිසුන් ඇතුලත් කිරීම පිළිබඳ පරිපාටියට එකඟවීමට ද, කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ අවසාන තීරණය පිළිගැනීමට ද පොරොන්දු වෙමි.

—————,
අයදුම්කරුගේ අත්සන

දිනය :—————.

රු. 10 ක මුද්දර අලවා ඒ මත අත්සන තබා අවලංගු කරන්න.

**තාක්ෂණ විද්‍යාල ලැයිස්තුව**

| *අනු අංකය* | *තාක්ෂණ විද්‍යාලය* | *ලිපිනය* | *දිස්ත්‍රික්කය* |
|---|---|---|---|
| 01 | ශ්‍රී ලංකා තාක්ෂණ විද්‍යාලය, මරදාන | ඕල්කොට් මාවත, කොළඹ 10 | කොළඹ |
| 02 | තාක්ෂණ විද්‍යාලය, ගාල්ල | කළුවැල්ල, ගාල්ල | ගාල්ල |
| 03 | තාක්ෂණ විද්‍යාලය, මහනුවර | අරුප්පල, මහනුවර | මහනුවර |
| 04 | තාක්ෂණ විද්‍යාලය, යාපනය | බ්‍රවුන්ස් පාර, යාපනය | යාපනය |
| 05 | තාක්ෂණ විද්‍යාලය, බදුල්ල | ග්‍රීන්ලේන් ඩ්‍රයිව්, බදුල්ල | බදුල්ල |
| 06 | තාක්ෂණ විද්‍යාලය, අනුරාධපුර | නවනගරය, අනුරාධපුර | අනුරාධපුර |
| 07. | තාක්ෂණ විද්‍යාලය, කුරුණෑගල | පුත්තලම් පාර, කුරුණෑගල | කුරුණෑගල |
| 08. | හාඩි තාක්ෂණ විද්‍යාලය, අම්පාර | ඉඟිනියාගල පාර, අම්පාර | අම්පාර |
| 09. | තාක්ෂණ විද්‍යාලය, රත්නපුර | ෆාර්ම් ගාර්ඩ්න්, කොළඹ පාර, රත්නපුර | රත්නපුර |

තාක්ෂණ විද්‍යාලවල පැවැත්වෙන ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම් - 5 (NVQ Level - 5)
ඩිප්ලෝමා මට්ටමේ පාඨමාලාවන්ට ඇතුලත්වීම සඳහා සුදුසුකම්

| අනු අංකය | පාඨමාලා සංකේත අංකය | පාඨමාලාවේ නම හා ස්වභාවය | පැවැත්වෙන තාක්ෂණ විද්‍යාලය | ඇතුලත්වීමේ සුදුසුකම්<br>* පහත දැක්වෙන පාඨමාලාවක් හදාරා NVQ මට්ටම් 3/4 සහතික ලබා තිබිය යුතුය.<br>* වයස අවුරුදු 17ට වැඩිවිය යුතුය. |
|---|---|---|---|---|
| 01 | ETB 01 | විදුලි සංදේශ තාක්ෂණය<br>පූර්ණ කාල - දිවා<br>එක් අවුරුදු | ගාල්ල | පරිඝණක දෘඩාංග ශිල්පී<br>පරිඝණක ජාලකරණ ශිල්පී<br>ගුවන් විදුලි යන්ත්‍ර හා රූපවාහිනී අළුත්වැඩියා කාර්මික |
| 02 | ETB 04 | මෙකාට්‍රොනික්ස් තාක්ෂණය<br>පූර්ණ කාල - දිවා<br>එක් අවුරුදු | මරදාන, ගාල්ල | ගුවන් විදුලි යන්ත්‍ර හා රූපවාහිනී අළුත්වැඩියා කාර්මික<br>පරිඝණක දෘඩාංග ශිල්පී<br>විදුලි කාර්මික<br>වායු කාර්මික ශිල්පී<br>මෝටර් රථ කාර්මික ශිල්පී<br>මෝටර් රථ විදුලි කාර්මික ශිල්පී<br>ගෘහස්ථ විදුලි උපකරණ අළුත්වැඩියා කාර්මික |
| 03 | ETB 06 | ඉදිකිරීම් තාක්ෂණය<br>පූර්ණ කාල - දිවා<br>එක් අවුරුදු | බදුල්ල, කුරුණෑගල<br>අනුරාධපුර | ගොඩනැගිලි ඉදිකිරීම් ශිල්පී<br>ලී වැඩ ශිල්පී (ඉදිකිරීම්)<br>ඉදිකිරීම් ක්ෂේත්‍ර පරීක්ෂක<br>ජලනල ශිල්පී |
| | ETB 06.1 | ඉදිකිරීම් තාක්ෂණය<br>(සති අන්ත/අර්ධ කාල)<br>(NVQ Level -5 සඳහා<br>නියමිත පැය ගණන | ගාල්ල, අම්පාර | කර්මාන්ත ජලනල ශිල්පී<br>ගොඩනැගිලි පින්තාරු ශිල්පී<br>සැලසුම් ශිල්පී<br>සහකාර ප්‍රමාණ සමීක්ෂක |
| 04 | ETB 07 | මෝටර් රථ තාක්ෂණය<br>පූර්ණ කාල - දිවා<br>එක් අවුරුදු | අම්පාර, යාපනය,<br>කුරුණෑගල<br>මහනුවර | මෝටර් රථ කාර්මික ශිල්පී<br>මෝටර් රථ කාර්මික විදුලි ශිල්පී<br>මෝටර් රථ පින්තාරුකරු<br>මෝටර් සයිකල් සහ ත්‍රීරෝද රථ කාර්මික<br>ත්‍රීරෝද රථ කාර්මික |
| 05 | ETB 08 | ශීතකරණ හා වායුසමීසමන තාක්ෂණය<br>පූර්ණ කාල - දිවා<br>එක් අවුරුදු | අනුරාධපුර<br>රත්නපුර | ශීතකරණ හා වායුසමන කාර්මික ශිල්පී<br>මෝටර් රථ වායුසමන ශිල්පී<br>මෝටර් රථ විදුලි කාර්මික ශිල්පී<br>ගෘහස්ථ විදුලි උපකරණ අළුත්වැඩියා කාර්මික<br>විදුලි ශිල්පී |
| 06 | ETB 09 | ගොවි යන්ත්‍රෝපකරණ තාක්ෂණය<br>පූර්ණ කාල දිවා<br>එක් අවුරුදු | අනුරාධපුර | තේ කර්මාන්ත ශාලා යාන්ත්‍රික ශිල්පී<br>කෘෂි උපකරණ අළුත්වැඩියා කාර්මික<br>මෝටර් රථ කාර්මික ශිල්පී<br>යාන්ත්‍ර ශිල්පී<br>ඉදිකිරීම් යන්ත්‍රෝපකරණ අළුත්වැඩියා කර්මික |
| 07 | ETB 10.1 | ජීව වෛද්‍ය උපකරණ තාක්ෂණය<br>අර්ධ කාල | මරදාන | ජීව වෛද්‍ය උපකරණ ශිල්පී<br>රූපවාහිනී හා ගුවන් විදුලි යන්ත්‍ර උපකරණ අළුත්වැඩියා කාර්මික<br>විදුලි කාර්මික (NVQ මට්ටම් 04 පමණි) |
| 08 | ETB 11 | තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය<br>පූර්ණ කාල - දිවා<br>එක් අවුරුදු | මරදාන, මහනුවර<br>ගාල්ල, බදුල්ල<br>රත්නපුර, යාපනය<br>කුරුණෑගල | තොරතුරු සන්නිවේදන තාක්ෂණ ශිල්පී<br>පරිඝණක යෙදවුම් සහායක<br>පරිඝණක "ග්‍රැෆික් ඩිසයින්" ශිල්පී<br>පරිඝණක දෘඩාංග ශිල්පී<br>පරිඝණක ප්‍රකාශන ශිල්පී (Desktop Publisher)<br>පරිඝණක ජාලකරණ ශිල්පී |

| අනු අංකය | පාඨමාලා සංකේත අංකය | පාඨමාලාවේ නම හා ස්වභාවය | පැවැත්වෙන තාක්ෂණ විද්‍යාලය | ඇතුලත්වීමේ සුදුසුකම්<br><br>* පහත දැක්වෙන පාඨමාලාවක් හදාරා NVQ මට්ටම් 3/4 සහතික ලබා තිබිය යුතුය.<br>* වයස අවුරුදු 17ට වැඩිවිය යුතුය. |
|---|---|---|---|---|
| 09 | ETB 12 | පෑස්සුම් තාක්ෂණය<br>පූර්ණ කාල - දිවා<br>එක් අවුරුදු | මරදාන | පෑස්සුම්කරු<br>ලෝහ පිරිසකරකරු<br>මෝටර් වාහන වැද්දුම් ශිල්පී<br>වැද්දුම්කරු |
| 10 | ETB 14 | ආහාර තාක්ෂණය<br>පූර්ණ කාල - දිවා<br>එක් අවුරුදු | මහනුවර | බේකරි ශිල්පී<br>පළතුරු සහ එළවළු සැකසුම් ශිල්පී<br>සූපවේදී |
| 11 | ETB 15 | ස්වර්ණාභරණ<br>නිර්මාණය හා<br>නිෂ්පාදන තාක්ෂණය<br>පූර්ණ කාල - දිවා එක්<br>අවුරුදු | මරදාන | ස්වර්ණාභරණ සාදන්නා<br>ස්වර්ණාභරණ ගල් බැඳුම් ශිල්පී |
| 12 | ETB 16 | නිෂ්පාදන තාක්ෂණය<br>පූර්ණ කාල - දිවා<br>එක් අවුරුදු | මහනුවර | ඇළුමිනියම් පිරිසකර කරන්නා<br>යන්ත්‍ර ශිල්පී<br>ආවුධ සහ අච්චු තැනීම් ශිල්පී<br>පෑස්සුම් ශිල්පී<br>ලෝහ පරිසකරකරු<br>වැද්දුම්කරු |

02-303

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.